සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)

# 11 - බුද්ධ ධර්මය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)

# 11 - බුද්ධ ධර්මය
## අවසාන ලකුණු ගණනය කිරීම

| | | | | |
|---|---|---|---|---|
| I පත්‍රය : | බහුවරණ ප්‍රශ්න 40 කි | = | (1 x 40) | ලකුණු **40 යි** |
| II පත්‍රය : | 1 වැනි ප්‍රශ්නය | කොටස් 10 කි කෙටි පිළිතුරු | (2 x 10) | ලකුණු **20 යි** |

2 වැනි ප්‍රශ්නය (2 - 7 තෙක් තෝරාගත් ප්‍රශ්න 04 කට)

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

3 වැනි ප්‍රශ්නය

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

4 වැනි ප්‍රශ්නය

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

5 වැනි ප්‍රශ්නය

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

6 වැනි ප්‍රශ්නය

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

7 වැනි ප්‍රශ්නය — එක් කොටසකට ලකුණු 5 බැගින්

(ලකුණු 5 X 2 ) ලකුණු 10 යි.

**ලකුණු 40 යි.**
**මුළු ලකුණු 100 යි.**

**අවසාන ලකුණු ගණනය කිරීම**

| | |
|---|---|
| I පත්‍රයට ලකුණු | = 40 |
| II පත්‍රයට ලකුණු | = 60 |
| **මුළු ලකුණු** | = 100 |

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ................................................ √ △ 4/5

(ii) ................................................ √ △ 3/5

(iii) ................................................ √ △ 3/5

(03) එකතුව ➡ □ 10/15

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

OL/2021(2022)/11/S-I,II

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

11 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## බුද්ධ ධර්මය I

**උපදෙස්:**

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. සිදුහත් බෝසතාණන් වහන්සේ දේවාරාධනය ලැබීමෙන් පසු තම අවසන් උපත සඳහා සුදුසු පසුබිම තුවණින් විමසා බැලීම හඳුන්වනුයේ,
   (1) සමතිස් පෙරුම් පිරීම නමිනි.
   (2) පංච මහා විලෝකනය නමිනි.
   (3) පංච මහා ස්වප්න (සිහින) දැකීම නමිනි.
   (4) චතුරංග සමන්නාගත වීර්ය වැඩීම නමිනි.

2. තරුණ සිදුහත් කුමාරයාට ජීවිතයේ සැබෑ යථාර්ථය අවබෝධ වූයේ,
   (1) නිබ්බුත පද ඇසීමෙනි.
   (2) මාර දූවරුන්ගේ රංගනය දැකීමෙනි.
   (3) සතර පෙර නිමිති දැකීමෙනි.
   (4) නළඟනන්ගේ විප්‍රකාර දැකීමෙනි.

3. යසෝදරා දේවියට පුතකු ලද බව පණිවුඩකරුවකු මගින් අසන්නට ලැබුණු විට සිදුහත් බෝසතුන්ගේ මුවින් "රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං" යනුවෙන් ප්‍රකාශ වූයේ,
   (1) තම දේවියට පුතකු උපන් බව ඇසීම සතුට ගෙනදෙන්නක් වූ බැවිනි.
   (2) රාහුල කුමාරයාට අනාගතයේ බන්ධන ඇතිවන බැවිනි.
   (3) උපන් කුමාරයාට රාහුල යන නම තැබිය යුතු වූ බැවිනි.
   (4) ගිහිගෙයින් නික්ම පැවිදිවීමට බාධාවක් වන බැවිනි.

4. "අනුන් මාගේ, ධර්මයේ හෝ සංඝයාගේ අගුණ හෝ ගුණ කියතොත් ඉන් අසතුටට හෝ ප්‍රීතියට පත් නොවිය යුතු ය." බුදුරජාණන් වහන්සේ මෙලෙස දේශනා කළේ එක්තරා පරිබ්‍රාජකයකුගේ හා ඔහුගේ අන්තේවාසිකයාගේ කතාබහක් නිසා ය. ඒ දෙදෙනාගේ නම් ඇතුළත් වරණය කුමක් ද?
   (1) සුප්පිය හා සෝණදණ්ඩ
   (2) බ්‍රහ්මදත්ත හා සුප්‍රබුද්ධ
   (3) සුප්පිය හා බ්‍රහ්මදත්ත
   (4) සුප්පිය හා තෝදෙය්‍ය

5. බුදුරජාණන් වහන්සේ නිශ්ශබ්දතාව අගය කරන බවත්, තම අසපුවට උන්වහන්සේ වඩින නිසා නිශ්ශබ්දතාව ආරක්ෂා කරන ලෙසත් තම සිසුනට දන්වනු ලැබුයේ,
   (1) උපක ආජීවකයා විසිනි.
   (2) සංජය පිරිවැජියා විසිනි.
   (3) වංගීස බ්‍රාහ්මණයා විසිනි.
   (4) පොට්ඨපාද පිරිවැජියා විසිනි.

6. සිද්ධාර්ථ කුමාරයාගේ උත්පත්තිය හා බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණය සිදු වූ ස්ථාන දැක්වෙන වරණය කුමක් ද?
   (1) නිග්‍රෝධ උයන හා කලන්දක නිවාප
   (2) ලුම්බිණි සල් උයන හා උපවත්තන සල් උයන
   (3) ජීවක අඹ උයන හා සප්තපර්ණී ගුහාව
   (4) ලුම්බිණි සල් උයන හා ඉසිපතන මිගදාය

[දෙවැනි පිටුව බලන්න.

7. බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍ය වනයෙහි වැඩ වසමින් වඳුරකුගේ හා ඇතකුගේ උවටැන් ලබමින් ගත කළේ කිනම් වස්කාලය ද?
(1) පස්වන වස්කාලයයි. (2) නවවන වස්කාලයයි.
(3) අටවන වස්කාලයයි. (4) දහවන වස්කාලයයි.

8. බුදුරජාණන් වහන්සේගේ වර්ණනාවට භාජනය වූ උදේන, ගෝතමක, සත්තම්බක, සාරන්දද ආදී රමණීය චෛත්‍ය ස්ථාන පිහිටියේ,
(1) විශාලා මහනුවරයි. (2) රජගහ නුවරයි. (3) කිඹුල්වත් නුවරයි. (4) උදේනි නුවරයි.

9. සුදත්ත සෙටුන් අනේපිඬු සිටුතුමාට බුදුරජාණන් වහන්සේ පළමුවරට මුණ ගැසුනේ උන්වහන්සේ,
(1) ඉසිපතන මිගදායේ වැඩසිටියදී ය. (2) අනෝමා නදී තීරයේ අනුපිය අඹ වනයේ වැඩසිටියදී ය.
(3) රජගහනුවර සීත වනයේ වැඩසිටියදී ය. (4) විශාලා මහනුවර කූටාගාර ශාලාවේ වැඩසිටියදී ය.

10. පුද්ගලයාට වැළඳෙන විවිධාකාර රෝගාබාධ හා ඒ සඳහා හේතුවන කරුණු පිළිබඳ පෙන්වාදෙමින් දේශනා කළ සූත්‍ර ධර්මය වන්නේ,
(1) ඉසිගිලි සූත්‍රයයි. (2) ගිරිමානන්ද සූත්‍රයයි.
(3) චුන්ද සූත්‍රයයි. (4) මහාසමය සූත්‍රයයි.

11. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය පරිදි, බඹරා මල නොතලා රොන් ගන්නාක් මෙන් භික්ෂූන් වහන්සේ ද සමාජයට බරක් නොවන ආකාරයෙන් සැදැහැවතුන්ගෙන්,
(1) පින් ලබාගත යුතු ය. (2) සිව්පසය ලබාගත යුතු ය.
(3) ගරු සම්මාන ලබාගත යුතු ය. (4) මිල මුදල් ලබාගත යුතු ය.

12. සම්මා සම්බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝධිසත්වයන් වහන්සේලා දස පාරමිතා තුන් ආකාරයකින් සම්පූර්ණ කිරීමෙන් පාරමිතා ධර්ම තිහක් බවට පත් වේ. එම තුන් ආකාරය,
(1) දාන, සීල, භාවනා නම් වේ. (2) සම්මා සම්බුද්ධ, පච්චෙක බුද්ධ, අරහන්ත බුද්ධ නම් වේ.
(3) සීල, සමාධි, ප්‍රඥා නම් වේ. (4) පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී නම් වේ.

13. තණ්හා මාන මිථ්‍යාදෘෂ්ටියෙන් තොරව, කරුණා ප්‍රඥාවෙන් යුතුව, කය වචන දෙකෙහි සංවර බව ඇතිකර ගනිමින් සම්පූර්ණ කරන පාරමිතාව හඳුන්වනුයේ,
(1) සීල පාරමිතාව නමිනි. (2) සච්ච පාරමිතාව නමිනි.
(3) ඛන්ති පාරමිතාව නමිනි. (4) නෙක්ඛම්ම පාරමිතාව නමිනි.

14. සිදුහත් බෝසතාණන් වහන්සේ උපේක්ෂා පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය ප්‍රකට වන ජාතක කථාව කුමක් ද?
(1) මඝමානවක ජාතකය (2) ලෝමහංස ජාතකය
(3) උම්මග්ග ජාතකය (4) වට්ටක ජාතකය

15. ධර්ම රත්නයේ ගුණ අතර "තමා විසින්ම පිළිපැද, මෙලොවදීම ප්‍රතිඵල දැකගත හැකිවීමේ ගුණය" හැඳින්වෙන්නේ,
(1) සන්දිට්ඨික නමිනි. (2) අකාලික නමිනි. (3) ඒහිපස්සික නමිනි. (4) ඕපනයික නමිනි.

16. පටිච්ච සමුප්පාද න්‍යායට අනුව "හේතුං පටිච්ච සම්භූතං හේතු භංගා නිරුජ්ඣති" යන්නෙන් අදහස් කරන ලද්දේ,
(1) ඕනෑම දෙයක් ඇතිවීමට කිසියම් හේතුවක් බලපාන බවයි.
(2) හේතු සොයා බලා ඒවාට ප්‍රතිකර්ම කළ යුතු බවයි.
(3) හේතු නැතිවන විට, ඒ හේතු නිසා හටගත් ඵල ද නැතිව යන බවයි.
(4) හේතුවක් කරණකොට උපන් සියල්ල විනාශවන බවයි.

17. "මහණෙනි, දුප්පතුන්ට ධනය නුපදනා කළ දිළිඳුකම වැඩි වේ." යනාදී වශයෙන් හේතුඵල දහම අනුව සමාජ ගැටලු ඇතිවන ආකාරය පැහැදිලි කරමින් දේශනා කළ සූත්‍ර ධර්මය කුමක් ද?
(1) සාමඤ්ඤඵල සූත්‍රය (2) චක්කවත්ති සීහනාද සූත්‍රය
(3) බ්‍රහ්මජාල සූත්‍රය (4) කසී භාරද්වාජ සූත්‍රය

18. බෞද්ධ ඉගැන්වීම අනුව සත්ත්වයා හා ලෝකය යනු ස්කන්ධ ධර්ම පහක එකතුවකි. එම ස්කන්ධ ධර්ම පහ,
(1) රූප, වේදනා, සඤ්ඤා, චේතනා, විඤ්ඤාණ නම් වේ.
(2) රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ නම් වේ.
(3) රූප, වේදනා, තණ්හා, උපාදාන, භව නම් වේ.
(4) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ නම් වේ.

[තුන්වැනි පිටුව බලන්න.

19. පහත සඳහන් සූත්‍ර අතුරෙන් කුසලාකුසල කර්ම හා කර්ම විපාක පිළිබඳව මනාව විස්තර කර දෙන සූත්‍ර ධර්මය වන්නේ,
(1) අනත්ත ලක්ඛණ සූත්‍රයයි.　(2) පරාභව සූත්‍රයයි.
(3) චූල්ල කම්මවිභංග සූත්‍රයයි.　(4) මහා මංගල සූත්‍රයයි.

20. බුදුරජාණන් වහන්සේ තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයාට දේශනා කළ පරිදි, යමෙකු දුර්වර්ණව උපත ලැබීම සඳහා ඉවහල්වන ක්‍රියාව වන්නේ,
(1) ප්‍රාණඝාතයෙහි නිරත වීමයි.　(2) ද්වේශයෙන් කටයුතු කිරීමයි.
(3) තමා සතු කිසිවක් අන් අයට නොදීමයි.　(4) අන් සැපතට ඊර්ෂ්‍යා කිරීමයි.

21. "සිහින් ඇඹිච අල්ලා ගැනීම හේතුකොට ගෙන නැවත නැවත භවයට එකතු වේ" යන්න සඳහන් අනුලෝම පටිච්චසමුප්පාද පාඨය කුමක් ද?
(1) "සංඛාර පච්චයා විඤ්ඤාණං".　(2) "ඵස්ස පච්චයා වේදනා"
(3) "උපාදාන පච්චයා භවො"　(4) "භව පච්චයා ජාති"

22. පංච නීවරණ ධර්ම අතරට අයත් 'සිතෙහි නොසන්සුන්කම හා කළ නොකළ දේ පිළිබඳ සිතෙහි ඇතිවන පසුතැවිල්ල' හඳුන්වනු ලබන්නේ,
(1) ව්‍යාපාද නමිනි.　(2) ථිනමිද්ධ නමිනි.
(3) උද්ධච්ච කුක්කුච්ච නමිනි.　(4) විචිකිච්ඡා නමිනි.

23. යහපතට යෙදූ විට මව්පියන් කරන යහපතට වඩා යහපතක් සිදු කරන්නා වූත්, අයහපතට යෙදූ විට සතුරකු කරන අයහපතට වඩා අයහපතක් සිදු කරන්නා වූත් එකම සාධකය ලෙස බුදුදහමෙහි පෙන්වා දෙනු ලබන්නේ,
(1) සිතයි.　(2) කයයි.　(3) වචනයයි.　(4) වේදනාවයි.

24. බුදුදහමෙහි විස්තර වන පංච බලි සංකල්පයෙහි එන 'පුබ්බපේත බලි' යන්නෙහි අර්ථය වන්නේ,
(1) ඥාතීන්ට සංග්‍රහ කිරීමයි.　(2) ආගන්තුකයින්ට සංග්‍රහ කිරීමයි.
(3) මියගිය ඥාතීන්ට පින් දීමයි.　(4) දෙවියන්ට පින් අනුමෝදන් කිරීමයි.

25. කරුණු නොදැන පදනමකින් තොරව ඇති කරගත් ශ්‍රද්ධාව, ධර්මයෙහි හඳුන්වනු ලබන්නේ,
(1) අමූලිකා සද්ධා නමිනි.　(2) ආකාරවතී සද්ධා නමිනි.
(3) අචල සද්ධා නමිනි.　(4) අවෙච්චප්පසාද සද්ධා නමිනි.

26. පුද්ගලයකුගේ ප්‍රතිසන්ධිය ලබාදීමට ඉවහල්වන කර්මය හඳුන්වනු ලබන්නේ,
(1) ජනක කර්ම නමිනි.　(2) උපත්ථම්භක කර්ම නමිනි.
(3) උපපීඩක කර්ම නමිනි.　(4) උපඝාතක කර්ම නමිනි.

27. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව ප්‍රකාශ කළ ප්‍රථම උදාන වාක්‍යයෙන්, දුක් සහිත පංචස්කන්ධය නමැති ගෘහය නිර්මාණය කරන අදෘශ්‍යමාන බලවේගය ලෙස හඳුන්වා ඇත්තේ,
(1) අවිද්‍යාවයි.　(2) වේදනාවයි.　(3) තෘෂ්ණාවයි.　(4) විඤ්ඤාණයයි.

28. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට බෙදා දැක්වීමේදී සීලය යටතට අයත් මාර්ග අංග ඇතුළත් වරණය තෝරන්න.
(1) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා
(2) සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම
(3) සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි
(4) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව

29. බුදුරජාණන් වහන්සේ අනේපිඬු සිටුතුමාට දේශනා කළ 'පත්තකම්ම සූත්‍රයේ' ධනය හෙවත් භෝග සම්පත් මනාව පරිහරණය කිරීමට උපදෙස් ලබා දී ඇත. එහි දැක්වෙන කරුණු අතරට අයත් නොවන කරුණ කුමක් ද?
(1) ආත්මාර්ථය සඳහාම ධනය ඉපයිය යුතු ය.
(2) ධාර්මිකව උපයාගත් ධනය මනාව ආරක්ෂා කරගත යුතු ය.
(3) පංච බලි නම් යුතුකම් පහක් ඉටු කළ යුතු ය.
(4) මහණ බමුණන්ට සංග්‍රහ කිරීම සඳහා වැය කළ යුතු ය.

30. "අසවලා මට බැන්නේ ය. මට පහර දුන්නේ ය. මා පැරද වූයේ ය." යනාදී වශයෙන් වෛර බඳින්නාගේ වෛරය නොසන්සිඳෙන බව අවධාරණය කරමින් දේශනා කළ ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) "තං ච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති" යන්නයි.
(2) "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති" යන්නයි.
(3) "අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මෙ" යන්නයි.
(4) "සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානි ච" යන්නයි.

[හතරවැනි පිටුව බලන්න.

31. පාලකයකු විවිධ අදහස් හා මතවාද දරන පිරිස් සමග මධ්‍යස්ථව හා ගැටුමකින් තොරව කටයුතු කිරීම දස රාජධර්මවල ...
හැඳින්වෙන්නේ,
(1) මෘදු බව යනුවෙනි. (2) අක්‍රෝධය යනුවෙනි.
(3) ඉවසීම යනුවෙනි. (4) අවිරෝධතාව යනුවෙනි.

32. රාජ්‍ය පාලකයකු සම්බන්ධව සැලකීමේදී යුක්තිය-අයුක්තිය, හොඳ-නරක තෝරා බේරා ගැනීමට නොහැකිව ...
වී අගතිගාමී වීම හඳුන්වන්නේ,
(1) ඡන්දය ලෙසයි. (2) ද්වේශය ලෙසයි.
(3) භය ලෙසයි. (4) මෝහය ලෙසයි.

33. අලුවිහාර සංගීතිය හෙවත් සිව්වන ථෙරවාදී සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු අතරට අයත් නොවන කරුණ
කුමක් ද?
(1) වලගම්බා රාජ්‍ය සමයේ ඇති වූ බැමිණිතියා සාගතය නිසා භික්ෂූන්ට ප්‍රත්‍ය පහසුව නොලැබීම
(2) මහා විහාරීය භික්ෂූන් වහන්සේලාට රාජානුග්‍රහය නොමදව ලැබීම
(3) දකුණු ඉන්දිය ආක්‍රමණිකයන්ගෙන් සිහසුනට එල්ල වූ බලපෑම
(4) ලක්දිව ඇතැම් භික්ෂූන් ශාසනික පිළිවෙත්වලින් ඈත් වීම

34. "ඇවැත්නි, ශෝක නොකරව්. නොවැලපෙව්. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මැනවින් මිදුණෝ වෙමු." යන ප්‍රකාශ...
කරනු ලැබුයේ,
(1) සුදින්න භික්ෂුව විසිනි. (2) දේවදත්ත භික්ෂුව විසිනි.
(3) ඡබ්බග්ගිය භික්ෂූන් විසිනි. (4) සුභද්‍ර භික්ෂුව විසිනි.

35. පළමු ධර්ම සංගායනාවෙන් පසු සසුනේ සුරක්ෂිත බව ඇති කරලීම සඳහා ධර්ම කොටස් මුඛ පරම්පරාගත...
රැගෙන යාමට භාණක පරම්පරාවන්ට භාර කෙරුණි. ඒ අනුව දීඝ නිකාය භාර දෙනු ලැබුවේ,
(1) ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
(2) සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
(3) අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
(4) මහා කාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.

36. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් නොවන කරුණ කුමක් ද?
(1) දස වස්තුව අකැප බව තීරණය කිරීම
(2) අටලොස් නිකායක් දක්වා ශාසනය බෙදීයාමට මූලබීජ සැපයීම
(3) භික්ෂු පිරිස ස්ථවිරවාද හා මහාසංඝික ලෙස බෙදීයාම
(4) විසිරී පැවති ධර්මය ඒකරාශී කොට නිකාය පහකට බෙදීම

37. ගර්භයේ හැඩය තෙල්ලි ගෙඩියක ස්වරූපයෙන් ගොඩනංවන ලද ස්තූප හැඳින්වෙන්නේ,
(1) ඝණ්ඨාකාර ස්තූප ලෙසයි. (2) ඝටාකාර ස්තූප ලෙසයි.
(3) පද්මාකාර ස්තූප ලෙසයි. (4) ආමලකාකාර ස්තූප ලෙසයි.

38. බෝධි වෘක්ෂයේ ආරක්ෂාවට තිමකර ඇති පියස්සක් සහිත මණ්ඩපය බෝධිඝරය ලෙස හඳුන්වන අතර ඇ...
කලාත්මක බවින් උසස් බෝධිඝරයක් හමුවී ඇත්තේ,
(1) වැල්ලවායේ බුදුරුවගලිනි. (2) පොළොන්නරුවේ ගල් විහාරයෙනි.
(3) කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගමිනි. (4) මාතලේ ආලෝක විහාරයෙනි.

39. ආබද්ධ හිටි පිළිමයක් සඳහා නිදසුනක් ලෙස දැක්විය හැක්කේ,
(1) අවුකන බුද්ධ ප්‍රතිමාවයි. (2) මාලිගාවිල බුද්ධ ප්‍රතිමාවයි.
(3) තොළුවිල සමාධි බුද්ධ ප්‍රතිමාවයි. (4) තන්තිරිමලේ බුද්ධ ප්‍රතිමාවයි.

40. පාලි භාෂාව නොදත් සාමාන්‍ය ජනතාවට උපදේශ සැපයීම සඳහා විදාගම මෛත්‍රී හිමියන් විසින් රචිත ...
බණපොත කුමක් ද?
(1) කාව්‍යශේඛරය (2) ලෝවැඩ සඟරාව
(3) ලෝකෝපකාරය (4) සුභාෂිතය

* *

[පස්වැනි පිටුව බ...

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)
# க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2021 (2022)

විෂය අංකය / பாட இலக்கம் **11**

විෂයය / பாடம் **බුද්ධ ධර්මය**

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 2 | 21. | 3 | 31. | 4 |
| 02. | 3 | 12. | 4 | 22. | 3 | 32. | 4 |
| 03. | 4 | 13. | 1 | 23. | 1 | 33. | 2 |
| 04. | 3 | 14. | 2 | 24. | 3 | 34. | 4 |
| 05. | 4 | 15. | 1 | 25. | 1 | 35. | 1 |
| 06. | 2 | 16. | 3 | 26. | 1 | 36. | 4 |
| 07. | 4 | 17. | 2 | 27. | 3 | 37. | 4 |
| 08. | 1 | 18. | 4 | 28. | 4 | 38. | 3 |
| 09. | 3 | 19. | 3 | 29. | 1 | 39. | 1 |
| 10. | 2 | 20. | 2 | 30. | 3 | 40. | 2 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)

## 11 - බුද්ධ ධර්මය

### II පත්‍රය

1. (i) සිදුහත් කුමාරයාට කුඩා කළ ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයාගේ නම කුමක් ද?
(ii) ධර්ම රත්නයේ ගුණ දැක්වෙන පාඨයේ සඳහන් 'සන්දිට්ඨිකො' යන්නෙහි අදහස ලියන්න.
(iii) "යාදිසං වපතේ බීජං තාදිසං හරතේ ඵලං" යන පාඨයේ අර්ථය ලියන්න.
(iv) උම්මග්ග ජාතකයෙන් ප්‍රකට වන්නේ, අප මහ බෝසතාණන් වහන්සේ කිනම් පාරමිතාවක් සම්පූර්ණ කළ ආකාරය ද?
(v) ත්‍රිපිටකය නම් කරන්න.
(vi) සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි දෙමාපියන් විසින් තම දූ දරුවන්ට ඉටුකළ යුතු යුතුකම් දෙකක් ලියන්න.
(vii) සතර අගතිය නම් කරන්න.
(viii) "සළායතන පච්චයා ඵස්සෝ" යන්නෙහි අර්ථය ලියන්න.
(ix) 'පූජාවලිය' රචනා කළ ගත් කතුවරයා සහ ඊට පාදක කරගෙන ඇති බුදුගුණය ලියා දක්වන්න.
(x) බුදුදහමේ දැක්වෙන නොකළ යුතු වෙළඳාම් දෙකක් ලියන්න.

(i). සර්වමිත්‍ර බමුණු පඬිවරයා / සර්වමිත්‍ර බමුණා / සර්වමිත්‍ර

(ලකුණු 02යි)

(ii). තමා විසින් ම පිළිපැද ඇස්පනාපිට මෙලොවදීම ප්‍රතිඵල දැක ගත හැකි / මෙලොවදී ම ඵල ලැබිය හැකි / සාංදෘෂ්ටික / තමා විසින් ම පිළිපැද මෙලොවදී ම ප්‍රතිඵල දැකගත හැකිවීම.

(ලකුණු 02යි)

(iii). වපුරන ලද බීජයට අනුරූපව අස්වැන්න ලබයි / යම්සේ බීජ වපුරයි ද එසේ ඵල ලබයි / වැපිරූ බීජ අනුව ඵල ලබයි. / වපුල බිජුවට අනුව ඵල නෙලයි.

(ලකුණු 02යි)

(iv). ප්‍රඥා පාරමිතාව

(ලකුණු 02යි)

(v). 1. සූත්‍ර පිටකය
2. විනය පිටකය
3. අභිධර්ම පිටකය

සූත්‍ර විනය අභිධර්ම ලෙස ලියා තිබුණද ලකුණු දෙන්න.

(ලකුණු 02යි)

(iii) කර්මය හා කර්ම ඵලය පිළිබඳ අවබෝධය පුද්ගල හා සමාජ යහපතට ඉවහල් වේ. කුසලාකුසල කර්මවල අනුරූපී විපාක පවතින බව පිළිගැනීම තුළින් පුද්ගලයා යහපත් ක්‍රියා කිරීමට පෙළඹේ. අකුසල් කිරීමට බියවේ. මෙලොව මෙන්ම පරලොව ජීවිතයක් ඇතිබව විශ්වාස කිරීමෙන් පරලොව ජීවිතය සැපවත් කර ගැනීම සඳහා කුසල කර්ම සිදු කිරීමට යොමුවේ. සුගතියක හෝ දුගතියක ඉපදීම කර්මානුරූපීව සිදුවේය යන පිළිගැනීමෙන් හා අකුසලයෙන් වැලකී කුසලයෙහි යෙදීම තුළින් දෙලොව ජීවිතයම සාර්ථක කර ගැනීමට හැකිවේ යන අවබෝධයෙන් පුද්ගල හා සමාජ යහපත සැලසේ.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.

(ලකුණු 05 යි.)

5. (i) අමාවතුර රචනා කළ කතුවරයා සහ ඊට පාදක වූ බුදුගුණය ලියා දක්වන්න.
(ii) පන්සිය පනස් ජාතක පොත් වහන්සේ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
(iii) ශ්‍රී ලාංකික ජන ජීවිතය සකස් කරගැනීමට සිංහල බෞද්ධ සාහිත්‍යයෙන් ලැබුණු පිටිවහල විස්තර කරන්න.

5. (i). කතුවරයා: ගුරුළුගෝමී පඬිතුමා / ගුරුළුගෝමී

පාදක වූ බුදු ගුණය: පුරිස දම්ම සාරථී බුදු ගුණය / පුරිස දම්ම සාරථී / පුරුෂයන් දමනය කිරීමේ ගුණය

එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු 2 දෙන්න.

(ලකුණු 02යි.)

(ii). පන්සිය පණස් ජාතක පොත් වහන්සේ.

පාලි ජාතකට්ඨකථාව සිංහලට පරිවර්තනය කිරීමෙන් රචිත කෘතියයි. බුදුරජාණන් වහන්සේ පාරමිදම් පුරණ සමයේ හෙවත් බෝධිසත්ව අවධියේ උපන් ආත්මභාව පිළිබඳ මෙහි විස්තර වේ. ධර්ම දේශනා ශෛලියෙන් රචිත මෙහි කථා වස්තු 547ක් ඇතුළත් වේ. මෙය මහජනතාව අතර මහත් ගෞරවාදරයට පාත්‍ර වූ කෘතියකි.

කෙටි හැඳින්වීමක් තිබේනම් ලකුණු 3 දෙන්න.

(ලකුණු 03 යි.)

(iii). ශ්‍රී ලාංකේය ජන ජීවිතය සකස් කර ගැනීමට සිංහල බෞද්ධ සාහිත්‍යයෙන් අනුපමේය පිටිවහලක් සැලසින. අනුරාධපුර යුගයේ සිට ඒ ඒ යුගවල ලියවුණු ගද්‍ය පද්‍ය කෘති මගින් සිංහල බෞද්ධ ජනතාවගේ අධ්‍යාත්මික ගුණ වගාව මෙන්ම සාහිත්‍ය රසාස්වාදයද එකසේ සැලසින. තෙරුවන් ගුණ පාදක කොට ලියැවුණු සාහිත්‍ය ග්‍රන්ථ මගින් මහජනතාවගේ බුද්ධාලම්බන ප්‍රීතිය මෙන්ම ශ්‍රද්ධා භක්තිය ඔප් නැංවුණි.එසේම ඒ තුළින් අධ්‍යාත්මික ශික්ෂණයක්ද ඇතිවිය. දළදාව, ශ්‍රී මහා බෝධිය, ස්තූප ආදී පූජා වස්තූන් පාදක කොට රචනා වූ ග්‍රන්ථ මගින්ද ජනතාව තුළ ශ්‍රද්ධා භක්තිය ජනිත විය. විශේෂයෙන්ම පන්සිය පණස් ජාතක පොත් වහන්සේ මෙහිලා විශේෂ කාර්ය භාරයක් ඉටු කළ බව පැහැදිලි ය. මෙම සාහිත්‍ය ග්‍රන්ථ සේවනය මගින් තම ජීවිත සාර්ථක කර ගැනීමටද මහ ජනතාවට අවස්ථාව සැලසින.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.

(ලකුණු 05 යි.)

6. (i) තෙවන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා හේතු වූ කරුණු දෙකක් නම් කරන්න.
(ii) එම සංගායනාව පැවැත්වීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහරහතන් වහන්සේ, අනුග්‍රහය ලබා දුන් පාලකයා හා පැවැත්වූ ස්ථානය ලියා දක්වන්න.
(iii) එම සංගායනාවේ ප්‍රතිඵල ශාසන ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය පහදන්න.

6. (i).
- ★ ලාභ අපේක්ෂාවෙන් දුසිල් භික්ෂූන් සසුන්ගත වීම
- ★ වසර හතක් සිල්වත් භික්ෂූන් වහන්සේලා පොහොය කර්ම නොකිරීම
- ★ දුසිල් මහණුන් සසුනින් තෙරපීම
- ★ පිරිසිදු බුදු දහම ආරක්ෂා කිරීම

එක් කරුණකට ලකුණ බැගින් ලකුණු 02 දෙන්න.

(ලකුණු 02 යි)

(ii) . මූලිකත්වය ගෙන ක්‍රියාකළ මහරහතන් වහන්සේ : මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ.

අනුග්‍රහය ලබා දුන් පාලකයා: ධර්මාශෝක රජතුමා / අශෝක රජතුමා

පැවැත් වූ ස්ථානය : පැළලුප් නුවර අශෝකාරාමයේදී / පැළලුප් නුවරදී / පායලීපුත්‍ර නගරයේදී / අශෝකාරාමයේදී.

එක් කරුණකට ලකුණ බැගින් ලකුණු 03 දෙන්න

(ලකුණු 03 යි.)

(iii). තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ශාසන ඉතිහාසය කෙරෙහි දැඩිව බලපා ඇත. අධර්මවාදී දුශ්ශීල භික්ෂූන් සසුනින් නෙරපා හැර පිරිසිදු ථේරවාදී බුදු දහම ආරක්ෂා කිරීමට පියවර ගැනුණි. කථාවත්ථුප්පකරණය ඇතුළත් කිරීමෙන් අභිධර්ම පිටකය සම්පූර්ණ විය. ධර්මාශෝක රජතුමාගේ ධර්මවිජය ප්‍රතිපත්තිය අනුව ථේරවාදී බුදු දහම දේශ දේශාන්තරවල ව්‍යාප්තවීමද සිදුවූයේ මෙම සංගායනාවෙන් අනතුරුවය. ශ්‍රී ලංකාව ඇතුලු රටවල් නවයකට බුදු දහම පිටත්කර හැරීම හෙවත් නවරට සසුන් පිහිටුවනු ලැබුයේ ද මෙම සංගායනාවේ ප්‍රතිඵල වශයෙනි.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.
(ලකුණු 05 යි.)

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට කෙටි සටහන් ලියන්න.
(i) වැලිවිට සරණංකර සංඝරාජ මාහිමි
(ii) ආරක්ඛ සම්පදා
(iii) සම්මා වාචා
(iv) වාහල්කඩ

7. (i). <u>වැලිවිට සරණංකර මාහිමි</u>

1698 ජුනි 18 වෙනි දින උඩරට තුම්පනේ ප්‍රදේශයේ වැලිවිට ග්‍රාමයේ කුලතුංග බණ්ඩාර නමින් උපත ලද මොහු වයස අවුරුදු 16 දී වැලිවිට සරණංකර නමින් පැවිදි බිමට පත්විය. උන්වහන්සේ බොහෝ දේ උගත්තේ ස්වෝත්සාහයෙනි. එහිදී සිංහල පාලි සංස්කෘත බුද්ධ ධර්මය කාව්‍ය ශාස්ත්‍රය හා තවත් බොහෝ විෂයන් පිළිබඳ හසල දැනුමක් ලබා ගත්හ.

ශික්ෂාකාමී අල්පේච්ඡ ජීවිතයක් ගතකළ උන්වහන්සේ යැපුනේ පිඩුසිඟා වැඩීමෙනි. එමෙන්ම ගමින් ගමට වඩිමින් දහම් දෙසමින් අසරණයන්ට පිහිට වූහ. එබැවින් උන්වහන්සේ පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර හිමි යනුවෙන් ප්‍රසිද්ධ වූහ. මහනුවර යුගයේ ඇති වූ ශාසනික පරිහානිය හේතුවෙන් සසුන නගා සිටුවීම සඳහා ශාසන මාමක පිරිස් එකතු කොට සිල්වත් සමාගම පිහිටුවා ගත්හ.

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ උපකාර ඇතිව සියම් රටින් උපසම්පදාව රැගෙනවිත් මෙහි පිහිට වූහ. 1753 දී උන්වහන්සේ ඇතුළු 6 නමක් මෙරටදී උපසම්පදාව ලබාගත්හ. බුදු සසුන වෙනුවෙන් සිදු කරන ලද සුවිශාල මෙහෙවරට උපහාර වශයෙන් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් උන්වහන්සේ වෙත සංඝරාජ පදවිය පිරිනමන ලදි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)

## 11 - බුද්ධ ධර්මය

### සවිස්තර ලකුණු දීමේ පටිපාටිය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවේ දැක්වෙන පරිදි ජාතික අධ්‍යාපන පද්ධතිය මගින් ඉටුකරගත යුතු ජාතික පොදු අරමුණු 08 ක් වේ. එසේම මූලික නිපුණතා 07 ක් දැක්වේ. විධිමත් අධ්‍යාපනය මගින් මෙකී අරමුණු හා නිපුණතා සාක්ෂාත් කර ගැනීම අපේක්ෂිතය. මූලික නිපුණතා අතර පස් වැන්න ආගම හා ආචාර ධර්මයන්ට අදාළ නිපුණතාව වේ. එය පහත දැක්වේ.

5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතාව

"පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සාදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහා ගැනීම හා ස්වීයකරණය."

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක සමස්ත විෂයමාලාව තුළින් පොදු අරමුණු හා මූලික නිපුණතා ඉටුකරගත යුතු අතර, ආගමික අධ්‍යාපනය තුළින් ඉහත දැක්වෙන පස්වන නිපුණතාව සුවිශේෂීව සපුරාගත යුතුව පවතී.

බුද්ධ ධර්මය විෂය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී එහි විෂය කරුණු ප්‍රායෝගිකත්වයට නැඹුරු කරවීම වර්තමාන යුගයට අත්‍යවශ්‍යව පවතී. වනපොත්කරණයෙන් විෂය කරුණු හදාරා විභාග සමත්වීම එකම අරමුණ නොවිය යුතු අතර, ඉන් ඔබ්බට ගොස් දෛනික ජීවිතයේ විවිධ ගැටලුවලට සාර්ථකව මුහුණ දීමටත් දහම් කරුණු භාවිතයට ගැනීමටත්, බුදු දහමේ ඉගැන්වෙන ශ්‍රේෂ්ඨ ධර්ම කරුණු අනුව තම ජීවිතය සාර්ථක කරගැනීමටත් සිසුන් යොමු කරලීම අත්‍යවශ්‍ය වේ. සමබර පෞරුෂයකින් හෙබි සැදැහැති බෞද්ධයකු දැයට දයාද කිරීම බුදු දහම ඉගැන්වීමේ මූලික අරමුණු විය යුතුය. බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරුවරයා මේ පිළිබඳ සුවිශේෂීව අවධානය යොමු කළ යුතුවේ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ සැකසුන විෂයමාලාවක් පාසල් පද්ධතියට ඉදිරිපත් කෙරිණි. ඒ අනුව බුද්ධ ධර්මය විෂයයේ අරමුණු 07 ක් දැක්වේ. මෙම අරමුණු සපුරාලන අයුරින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකසා ගත යුතුවේ. එම විෂය අරමුණු මෙසේයි.

# II පත්‍රය - ඉගෙනුම් ඵල

01.

I. බුද්ධ චරිතය, ශ්‍රාවක ශ්‍රාවිකා චරිතවලට අදාළ මූලික කරුණු ගෙනහැර දක්වයි.
II. බුදු දහමේ ඉගැන්වෙන මූලික ධර්ම කරුණු නම් කරයි.
III. සරල පාලි පාඨවල අර්ථ පහදයි.
IV. තෙරුවන් ගුණ හැඳින අර්ථ දක්වයි.
V. පාරමිතාවන්ට අදාළ ජාතක කතා සනිදර්ශනව දක්වයි.
VI. බෞද්ධ සංස්කෘතියට අදාළ තොරතුරු විස්තර කරයි.
VII. ශාසන ඉතිහාසයට අදාළ සුවිශේෂී අවස්ථා සිද්ධි නම් කරයි.
VIII. බෞද්ධ සාහිත්‍ය කෘති නම් කරයි.

02.

I. බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම නම් කරයි.
II. එම භාවනා ක්‍රම පිළිබඳ අර්ථ විවරණ සපයයි.
III. ශිෂ්‍ය ජීවිත අර්ථවත් කරගැනීම සඳහා බෞද්ධ භාවනා උපයෝගි කරගනි.

03.

I. ධම්ම පද ගාථා නිවැරදිව සජ්ඣායනා කොට ලියා දක්වයි.
II. ධම්ම පද ගාථා වල අදහස සරළ බසින් ලියයි.
III. ධම්ම පද ගාථා වලින් ලබාදෙන සදුපදේශ ශිෂ්‍ය හා පුද්ගල ජීවිත සාර්ථක කර ගැනීමට ඉවහල් කරගනි.

04.

I. කර්මය පිළිබඳ බෞද්ධ විග්‍රහය පැහැදිළි කරයි.
II. කර්මය බෙදා දක්වන විවිධ ආකාර විස්තර කරයි.
III. කර්මය හා කර්ම ඵලය පිළිබඳ අවබෝධය පුද්ගල හා සමාජ යහපත සඳහා ඉවහල්වන අයුරු ගෙනහැර දක්වයි.

05.

I. බෞද්ධ සාහිත්‍ය ඇගයීමට ලක්කරයි.
II. ජාතක පොත් වහන්සේ පිළිබඳව අර්ථ විවිරණ සපයයි.
III. ශ්‍රී ලාංකීය ජන ජීවිතය සකසා ගැනීමට සිංහල බෞද්ධ සාහිත්‍ය උපකාරවත් වූ අයුරු පහදයි.

06.

I. ථේරවාදී බෞද්ධ ධර්ම සංගායනාවලට අදාළ සුවිශේෂී තොරතුරු ගෙනහැර දක්වයි.
II. තෙවන ධර්ම සංගායනාවට අදාළ සිද්ධි පෙලගස්වයි.

බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කරවා නිසි පූජා පැවැත්වීමට කටයුතු කළ උන්වහන්සේ මුනිගුණාලංකාරය, සාරාර්ථ සංග්‍රහය, රත්නත්‍රය ප්‍රණාම ගාථා සන්නය සතර බණවර සන්නය ආදී කෘති ද රචනා කළහ.

අපරිමිත ශ්‍රද්ධාවෙන් ශික්ෂාකාමී අල්පේච්ඡ ජීවිතයක් ගතකළ උන්වහන්සේ වයස අවුරුදු 80 ක් ආයු වළඳා 1778 ඇසළ පුර පසළොස්වක පොහෝදා අපවත් වී වදාළහ.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.
(ලකුණු 05යි.)

**(ii). ආරක්ඛ සම්පදා**

ධාර්මිකව උපයා සපයාගත් ලෞකික ධනය සුරක්ෂිත කර ගැනීම ආරක්ඛ සම්පදාවයි.ධනය විනාශවීමට ඇති ක්‍රමවලින් විනාශවීමට ඉඩ නොදී එය මැනවින් ආරක්ෂා කර ගැනීමයි. රජයට අයත්වීම සොර සතුරන් පැහැර ගැනීම , ගින්නෙන්, ජලයෙන් විනාශ වීම තමා ප්‍රිය නොකරන අයට අයත්වීමට ඉඩ නොදී ආරක්ෂා කර ගැනීම මින් අදහස් වේ.

(ලකුණු 05යි.)

**(iii). සම්මා වාචා**

සම්මා වාචා යනු ආර්ය අෂ්ටාංගික මාර්ගයේ තුන්වන මාර්ග අංගයයි. වචනයෙන් සිදුවන බොරු කීම, කේලාම් කීම, පරුෂ වචනකීම, හිස් වචන කථා කිරීම යන වාචසික දුරාචාරවලින් වැළකීමයි. සම්මා වාචා යනු අකුසල විරතියකි. එසේම සත්‍ය වචන, ප්‍රිය වචන අර්ථවත් වචන කථා කරන්නෙක් බවට පත්වීමද මීට අයත්වේ. වාචසික සංවරය මින් අදහස් වේ.

(ලකුණු 05යි.)

**(iv). වාහල්කඩ**

ශ්‍රී ලංකාවේ ස්තූපවල දක්නට ලැබෙන ගර්භයට සම්බන්ධ සිව් දිසාවට මුහුණ ලා තනන ලද අලංකාර තොරණ වැනි අංගය වාහල්කඩ නමින් හැදින්වේ. මෙය ආයක නමින්ද හැදින්වේ. වාහල්කඩක දෙපස මල් ලියකම් සහිත ශිලා ස්තම්භ දෙකක් පිහිටා ඇත. එහි මැද කොටස සමාන්තර තීරු යොදා හංස රූප, වාමන රූප, ඇත් හිස් හා බොරදම් යොදා අලංකාර කොට ඇත. මිහින්තලේ කණ්ඨක චෛත්‍යයෙහි නැගෙනහිර වාහල්කඩ උසස් කලාත්මක නිර්මාණයෙකි.

(ලකුණු 05 යි.)

********

# බුද්ධ ධර්මය - I

01. අධ්‍යාපන ක්‍රියා පද්ධතිය මගින් ශිෂ්‍ය - ශිෂ්‍යාවන් තුළ දැනුම ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කිරීම මූලික අභිමතාර්ථය වෙයි. හුදු දැනුම පමණක් යහපත් ශිෂ්ට සම්පන්න පුරවැසියකු බිහි කිරීමට ප්‍රමාණවත් නොවේ. අංග සම්පූර්ණ පුරවැසියකු වීමට යහපත් ආකල්ප පෝෂණයක් ද තදනුබද්ධව සංවර්ධනය විය යුතු පුද්ගල කෞශල්‍යය ද අත්‍යාවශ්‍ය වෙයි. බුද්ධ ධර්මය විෂයය නිර්දේශය සැකසී ඇත්තේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය සඳහාය. ඒ සඳහා බුද්ධ ධර්මය පාඨග්‍රන්ථ මගින් විශාල ප්‍රයත්නයක් දරා ඇති අතර, ආකල්ප හා කුසලතා වර්ධනය විෂයය භාර ගුරු මහත්ම මහත්මීන්ගේ දායකත්වය මගින් පෝෂණය කිරීම අපේක්ෂිතය. බුද්ධ ධර්මය ආගමික විෂයය නිර්දේශයක් වුවද එමගින් හුදු දැනුම පමණක් මනිනු නොලැබේ. ප්‍රශ්න සැකසී ඇත්තේ දැනුම, ආකල්ප සහ කුසලතා විනිශ්චය කිරීම සඳහාය.

02. ප්‍රශ්න හතළිහකින් යුත් පළමුවැනි ප්‍රශ්න පත්‍රය සඳහා වෙන්ව ඇති කාලය පැයකි. ප්‍රශ්න පත්‍රයේ ම දැක්වෙන පිළිතුරු හතරකින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ලකුණු කිරීම විභාග අපේක්ෂකයා විසින් කළ යුතුය.

03. ප්‍රශ්නයට අදාළ පිළිතුර සේ පෙනෙන එහෙත් නිවැරදි පිළිතුරු නොවන පිළිතුරු තුනක් තිබේ. දී ඇති පිළිතුරු සටහනින් නිවැරදි පිළිතුර තෝරා ගැනීම සඳහා බුද්ධ ධර්මය මැනවින් හදාරා තිබිය යුතුය.

04. අසා ඇති ප්‍රශ්න වහා අවබෝධකර ගැනීමේ ශක්තිය විභාග අපේක්ෂකයා සතු විය යුතුය. ප්‍රශ්නය නිසි ලෙස තේරුම් නොගැනීම අසාර්ථක පිළිතුරක් සැපයීමට හේතු විය හැකිය. ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගැනීමෙන් පසු නොපමාව නිවැරදි පිළිතුර කුමක්දැයි හඳුනාගෙන ලකුණු කළ යුතුයි.

05. පැයක පමණ කෙටි කාලයක් තුළ මේ සියලු කාර්යයන් ඉටු කළ යුතුව ඇති බැවින් ප්‍රශ්න පිළිබඳව නිරවුල් අවබෝධ ඥානය හා කාර්යක්ෂමභාවය සාර්ථක පිළිතුරු සැපයීමට බෙහෙවින් උපකාරවත් වේ.

06. සරල ප්‍රශ්න හතළිහකින් යුත් මේ ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වන්නේ බුද්ධ ධර්මය විෂයය සම්බන්ධ සාමාන්‍ය දැනීම පරීක්ෂාකර බැලීමය.

07. මේ ප්‍රශ්න පත්‍රයේ පිළිතුරුපත් ලකුණු කිරීමට පළමු පහත සඳහන් කරුණු කෙරෙහි පරීක්ෂකවරුන්ගේ දැඩි අවධානය යොමුවිය යුතුය.

   i. නිවැරදි වරණය තේරීමේ දී අපේක්ෂකයා ලකුණු කොට ඇත්තේ එක් වරණයක් පමණක් දැයි බලන්න. එක් වරණයකට වඩා වැඩි සංඛ්‍යාවක් ලකුණු කොට ඇත්නම් එම පිළිතුර ඉරක් ඇඳ කපා හරින්න.

   ii. සිදුරුපත් භාවිත කරන පරීක්ෂකවරුන් ප්‍රශ්නයේ අංකයත්, නිවැරදි පිළිතුරත් පැහැදිලිව පෙනෙන සේ සිය සිදුරුපත සකස්කර ගත යුතුය.

   iii. සිදුරුපත් මගින් හරි වැරදි ලකුණු කිරීමේ දී නිවැරදි වරණය සඳහන් කොටුව මත ලකුණු කිරීමෙන් වලකින්න. පිළිතුරට අදාළ ප්‍රශ්න අංකය ඉදිරියෙහි හරි වැරදි ලකුණු කරන්න.

   iv. නිවැරදි ලකුණු සංඛ්‍යාව ගණනය කොට අදාළ පේළිය යට මුළු සංඛ්‍යාව සටහන් කරන්න.

08. බුද්ධ ධර්මය ප්‍රශ්න පත්‍රයට අදාළ නිවැරදි උත්තර මතු දැක්වෙන සටහනෙහි පළවෙයි. නිවැරදි උත්තරයට එක් (01) ලකුණක් බැගින් හිමිවේ.

# I පත්‍රය - ඉගෙනුම් ඵල

1. බෝසත් චරිතයේ හා බුදු සිරිතේ සුවිශේෂී අවස්ථා නම් කරයි.
2. බෝසත් චරිතය හා බුද්ධ චරිතයේ සුවිශේෂී ගුණාංග දක්වයි.
3. බුද්ධ චරිතයේ සහ ශ්‍රාවක චරිත වල ඇති උතුම් ගුණාංග චරිතායනය කරයි.
4. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින ඒවා ආශ්‍රයෙන් තම ජීවිතය අර්ථවත් කර ගැනීමට සිතයි.
5. පාරමිතා අර්ථ සිමනය කර බෝසතුන් පාරමිතා පූරණය කල අවස්ථාවන්ට නිදසුන් සපයයි.
6. ගෘහස්ථ සීලය යන්න අර්ථ දක්වයි.
7. බුදු දහමේ මූලික ඉගැන්වීම් විස්තර කරයි.
8. බෞද්ධ කර්ම විග්‍රහයෙහි දැක්වෙන කොටස් නම් කරයි.
9. බෞද්ධ කලා ශිල්පයන්හි සුවිශේෂිතා අගය කරයි.
10. බෞද්ධ රාජ්‍ය පාලන ධර්ම අර්ථ දක්වයි.
11. ථෙරවාදී බෞද්ධ ධර්ම සංගායනාවන්ට අදාළ සුවිශේෂී අවස්ථා දක්වයි.
12. බෞද්ධ ශාසන ඉතිහාසයට අදාළ වැදගත් සිද්ධි දක්වයි.
13. ධම්ම පද පාඨයන්හි අර්ථ විවරණය කරයි.
14. බෞද්ධ සූත්‍ර ධර්ම ඇසුරින් මෙලොව ජීවිතය සාර්ථකව ගත කල හැකි ආකාරය පෙන්වා දෙයි.
15. බෞද්ධ සාහිත්‍ය කෘති පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
16. බෞද්ධ ධන පරිභෝග සංකල්පය විග්‍රහ කරයි.
17. බුදු දහමේ සිතීමට හා විමසීමට ලබා දී ඇති නිදහස අගය කරයි.
18. ධර්මාශෝක අධිරාජයාගේ ශාසනික සේවාව පහදයි.
19. බෞද්ධ සූත්‍ර ධර්මයන්හි අන්තර්ගත ධර්ම කරුණු පැහැදිලි කරයි.
20. බුදු දහමේ උගන්වන සදාචාර මූලධර්ම තම ජීවිත සාර්ථක කර ගැනීමට ඉවහල්කර ගනී.

## විෂයයේ අරමුණු

01. තිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවෙන් කටයුතු කරන, නිවැරදි ප්‍රායෝගික වතාවත්වල යෙදෙන දැහැමි දරු පරපුරක් බිහිකිරීම.

02. ජීවන ගමනේ දී මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සහ නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට බුදු දහමෙහි මූලික ඉගැන්වීම් උපයෝගී කර ගැනීම පිණිස දරු පරපුරට මඟ පෙන්වීම.

03. සුපෞරුෂයක් ගොඩනගා ගැනීම උදෙසා බෝසත් චරිතය, බුද්ධ චරිතය හා සිව්වනක් පිරිසට අයත් ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශ කොට ගැනීම සඳහා මඟ පෙන්වීම.

04. ශ්‍රී ලාංකීය උරුමය දයාද කොට ගත් අභිමානවත්, වගකීමෙන් සහ වගවීමෙන් යුතු දරු පරපුරක් ගොඩනගා ගැනීම.

05. සිය ජීවන දර්ශනය ගොඩනගා ගැනීමේ දී ධම්මපද දේශනා සහ බෞද්ධ උපදේශ කාව්‍ය පදනම් කරගත් ඉගැන්වීම් චරිතායනයට මඟ පෙන්වීම.

06. මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා භාවනාව පුහුණු කිරීමට යොමු කරවීම.

07. බෞද්ධ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂ අංග අධ්‍යයනය කොට, සහජීවනයෙන් කටයුතු කරන සිය අනන්‍යතාව රැක ගත් දරු පරපුරක් ගොඩනගා ගැනීම.

එසේම 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් ද්විතීයික විෂය නිර්දේශය මූලික නිපුණතා 10 ක් යටතේ ගොනු කර ඇත. 6 ශ්‍රේණියේ සිට නිපුණතා මට්ටම් හා විෂය අන්තර්ගතය ක්‍රමයෙන් ගැඹුරින් හා පළලින් වැඩිවන ලෙස සර්පිලාකාර ක්‍රමයට ව්‍යාප්ත වන ලෙස සැකසී ඇත. බුද්ධ ධර්මය විෂයයේ නිපුණතා 10 පහත දැක්වේ.

## බුද්ධ ධර්මය විෂයයේ නිපුණතා

01). තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.
02). ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක, ශ්‍රාවිකා චරිත උපයෝගී කර ගනියි.
03). බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.
04). සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි.
05). ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.
06). බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.
07). ජීවී, අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි.
08). ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.
09). බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි.
10). නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

ඉහත දැක්වූ විෂය අරමුණු 07 පෙරදැරි කරගෙන නිපුණතා 10 සම්පූර්ණ වන ලෙස විෂය ඉගැන්වීම සාර්ථකව සිදු කළේ නම් සිසුන් තුළ යහපත් ගුණවගාවන් සිදුවනු ඇත. මෙම අවශ්‍යතාවන් ඉටුවන ලෙස ප්‍රායෝගිකත්වයට නැඹුරුව තක්සේරුකරණය පාසල් පාදකව සිදුවිය යුතුය. අ.පො.ස. (සා.පෙළ) විභාගය යනු විෂය දැනුම පිළිබඳ සමාප්තික ඇගයීම වේ.

# බුද්ධ ධර්මය II

01. නව අධ්‍යාපන විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ විභාගය පැවැත්විණි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදකව (Competency Based) ක්‍රියාකාරකම් පාදකව (Activity Based) සිදුවන අතරම ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලියද නිපුණතා පාදකව නිර්ණායක මූලිකව (Competency Based Criterion Reference Assessment and Evaluation) සිදුකිරීමට ප්‍රයත්න දරා ඇත. නිපුණතාවක් දැනුම ආකල්ප කුසලතා හා යහපුරුදුවලින් යුක්ත වෙයි. නිපුණතාවක් දිගුකාලීනව ඇතිවන්නකි. ආගම හා සදාචාරයට අදාළ නිපුණතාවන් මෙන්ම බුද්ධ ධර්මය විෂයානුබද්ධ නිපුණතාවයන් ශිෂ්‍යයා ලබාගෙන තිබේද යන්න මැන බැලීම සඳහා ප්‍රශ්න පත්‍රය සැකසී ඇත.

බුද්ධ ධර්මය විෂය ක්ෂේත්‍රය පිළිබඳ අපේක්ෂකයා තුළ නිවැරදි අවබෝධය හා විෂය කරුණු විස්තරාත්මකව ඉදිරිපත් කිරීමේ හැකියාව ද, තමන් උගත් විෂය කරුණු ජීවිතය හා සමාජය සම්බන්ධ කොට විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙන් දක්වන නිපුණතා ද විමසා බැලීම මේ ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථය වෙයි.

02. බුද්ධ ධර්මය II ප්‍රශ්න පත්‍රයෙහි මතු දැක්වෙන උපදෙස් දී ඇත.

පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

★ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් බැගින් ද හිමි වේ.

ඒ අනුව එක් එක් ප්‍රශ්නයට, කොටස්වලට ලකුණු ප්‍රදානය කිරීමේදී දිය යුතු ලකුණු ප්‍රමාණය මතකයෙහි තබා ගත යුතුය. පළමුවන ප්‍රශ්නයට ලකුණු (10 x 2) 20 කි. 02 සිට 06 දක්වා ප්‍රශ්නවල

i කොටසට ලකුණු 2 ක් ද, ii කොටසට ලකුණු 3 ක් ද, iii කොටසට ලකුණු 5 ක් ද වශයෙන් ලකුණු 10 බැගින් හිමිවේ. 7 වන ප්‍රශ්නයේ කොටසකට ලකුණු 05 බැගින් කොටස් දෙකට ලකුණු (5 x 2) 10 කි. ඒ අනුව II පත්‍රයට ලකුණු (20 + 10 x 4 ) 60 කි.

03. බුද්ධ චරිතය, ශ්‍රාවක ශ්‍රාවිකා චරිත, බෞද්ධ චරිත කථා, බෞද්ධ ධර්මය, බෞද්ධ සමාජය, බෞද්ධාගමික චාරිත්‍ර, බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම, බෞද්ධ සාහිත්‍ය හා කලාශිල්ප, බෞද්ධ ශාසන ඉතිහාසය, ලක්දිව බුදුසසුන ආදිය පිළිබඳ විෂය නිර්දේශයට අදාළ කරුණු සම්බන්ධ සාමාන්‍ය ඥානය, විශේෂ ඥානය හා ප්‍රායෝගික අවබෝධය පරීක්ෂා කර බැලීම මේ ප්‍රශ්න පත්‍රයෙ බලාපොරොත්තු වනු ලැබේ.

දෙවන පත්‍රයේ අංක 1 ප්‍රශ්නය ඉදිරිපත් කොට ඇත්තේ බුද්ධ ධර්මය මූලික විෂය කරුණු කෙටියෙන් ලියා දැක්වීම සඳහා කෙටි ප්‍රශ්න 10 කින් සමන්විත ප්‍රශ්නයක් ලෙසය. එහි දී ශිෂ්‍යයාගෙ නම් කිරීමක්, අර්ථ දැක්වීමක්, කෙටියෙන් හැඳින්වීමක් වැනි ප්‍රජානන හැකියා ලියා ඉදිරිපත් කිරීම සිදුවේ. හිමි ලකුණු 20 කි. අංක 2 සිට 6 දක්වා ප්‍රශ්නවල i කොටසින් විෂයට අදාළ මූලික කරුණු පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම පරීක්ෂාවට ලක්කෙරෙයි. ii කොටසින් ඒ හා සම්බන්ධ කරුණු විග්‍ර කොට ඇති අයුරු අපේක්ෂකයා මනාව වටහාගෙන ඇත්දැයි විමසුමට ලක්කෙරේ. iii කොටසින් අදාළ විෂය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ විචාරාත්මක අවබෝධය හා නිදහස් චින්තනය පරීක්ෂාවට ල කරනු ලැබේ.

~~(ලකුණු 02යි)~~

(vi). දෙමාපියන් දූ දරුවන්ට ඉටුකළ යුතු යුතුකම්:

1. දරුවන් වරදින් මුදවා ගැනීම
2. යහපත් කටයුතුවල යෙදවීම
3. ඉගෙනීමේ කටයුතුවල යෙදවීම/ මැනෙවින් ඉගැන්වීම
4. ගැළපෙන ආවාහ විවාහ කරදීම
5. සුදුසු කල්හි සම්පත් පවරාදීම

මෙම කරුණු අතුරින් එක් කරුණකට ලකුණක් බැගින් ලකුණු 2 දෙන්න.

(ලකුණු 02යි)

(vii). ඡන්දය, ද්වේශය, භය, මෝහය/ ඡන්දා දෝසා භයා මෝහා

(ලකුණු 02යි)

(viii). සළායතන හේතුකොටගෙන ස්පර්ශය ඇතිවේ. / ආයතන හය හේතුවෙන් ස්පර්ශය ඇතිවේ. / ෂඩායතන හේතුවෙන් ස්පර්ශය ඇතිවේ.

(ලකුණු 02යි)

(ix). ගත් කතුවරයා: මයූරපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර හිමි/ මයූරපාද පිරිවෙන්පති හිමි / බුද්ධපුත්‍ර හිමි

පාදක කොට ඇති බුදු ගුණය: අරහං බුදු ගුණය / අරහං ගුණය/ අරහං

(ලකුණු 02 යි)

(x). නොකළ යුතු වෙළදාම් 5

1. අවි ආයුධ වෙළදාම / සත්ථ වණිජ්ජා
2. සත්ව වෙළදාම/ සත්ත වණිජ්ජා
3. මස් වෙළ දාම /මංස වණිජ්ජා
4. වස විස වෙළදාම / විස වණිජ්ජා
5. මත් ද්‍රව්‍ය වෙළදාම/ මජ්ජව වණිජ්ජා

මින් කරුණු දෙකක් ලියා ඇත්නම් ලකුණු 2 දෙන්න.

(ලකුණු 02යි)